## හැටන් - දික්ඔය නගර සභාව

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූලි 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

සභාපතිවරයා වෙත යවන ලද වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේත කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හැටන් - දික්ඔය නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්.

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 04 කට පිළිතුරු සපයා නොතිබුණි.

(ආ). ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම.

එකතුව රු. 154,500 ක් වූ ගෙවීම් වවුචර් 03 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.12,418,944 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.3,141,358 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය. | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). | වරිපනම් හා බදු | 6,243 | 6,405 | 2,608 |
| (ii). | බදු කළී | 10,753 | 8,227 | 6,023 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,000 | 1,109 | 170 |
| (iv). | වෙනත් ආදායම් | 33,525 | 22,037 | 29,819 |

2.2.2 මුද්දර ගාස්තු.

2011 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් රු.3,792,697 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වාහන උපයෝජනය.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාව සතු වාහන 06 ක මයිලෝ මීටර දිගු කාලයක සිට ක්‍රියා විරහිතවී ඇති අතර ඒවා අළුත් වැඩියා කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ). සභාවට අයත් වාහන දෙකක් සම්බන්ධයෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ). 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41 / 90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මිලගණන් වල සාධාරණත්වය පිළබඳ වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව රු. 216,305 ක් වැය කර අංක 37 ශ්‍රී 6504 දරන ට්‍රැක්ටරය අළුත්වැඩියා කර තිබුණි.

(ඈ). වසර 05ක පමණ කාලයක සිට ප්‍රයෝජනයකට නොගන්නා විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් ටයර් 13 ක් ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි.

2.4 අවිධිමත් ගණුදෙනු.
-----------------------

(අ). 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශයේ නියමයට පටහැනිව තරගකාරී මිලගණන් කැදවීමකින් තොරව මගනැඟුම උපදේශාත්මක හා ව්‍යාපෘතිසේවා කළමනාකරණ පෞද්ගලික සමාගමෙන් රු.353,435 ක් වටිනාකමට "කුල්මික්ස්" මිලදීගෙන තිබුණි.

(ආ). මුදල් කොමිෂන් සභාවේ ලේකම්ගේ 2006 මාර්තු 07 දිනැති අංක 2/2006 දරන චකලේඛයේ නියමයන්ට අනුව සමරුඑලකයක් වෙනුවෙන් වැයකළ හැකි උපරිම මුදල රු. 12,500 ක් වුවද, රු. 15,000 බැගින් සමරු එලක 23 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 57,500 ක් වැඩිපුර වැයකර තිබුණි.

2.5 ආර්ථිකමය නොවු ගණුදෙනු.
--------------------------------

හැටන් බස් නැවතම්පල අසල පිහිටි නගරසභා ඉඩමේ තෙමහල් වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා පස් පරීක්ෂණ වාර්තාවක් ලබාගැනීම පිණිස රු. 161,280 ක මුදලක් පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණද, එම කර්මාන්තය ඉඩම් ආරවුලක් මත අත්හිටුවීම නිසා ගෙවන ලද මුදල අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
-----------------------------

(අ). පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ රු. 60,850 ක් වටිනා සිමෙන්ති මලු 90 ක් සහ රු.129,600 ක් වටිනා සෙවිලි තහඩු 120 ක් පොන්නගර් කොළනියේ දිළිදු පවුල් 30 ක් වෙත බෙදාහැරීමට සැලසුම් කර තිබුණද, පවුල් 16 ක් වෙත පමණක් ද්‍රව්‍ය බෙදාහැර තිබුණි. ද්‍රව්‍ය ලබාදුන් එක් පවුලක් හෝ අඩු ආදායම් ලාභීන් බවට තහවුරු කර ගෙන නොතිබුණි. ද්‍රව්‍යලාභීන් ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව පවුල් 14 ක් වෙනත් ප්‍රදේශවල පදිංචිකරුවන් විය.

(ආ). සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව දික්ඔය නගර ශාලාවේ තිබූ රු.42,387 ක් වටිනා භාණ්ඩ අස්ථානගතවී තිබුණද, ඌණතාවයන්ගේ වටිනාකම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 04 ක 19% සිට 57% දක්වාද, වියදම් විෂයයන් 05 ක 19% සිට 87% දක්වාද, විචලනයන් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් වශයෙන් උපයෝගි කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

2.7 කාර්ය සාධනය.
-----------------
සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය.
------------------------
ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.